තරුවෙන් ගණිතය...

දිල්ශාන් බී ප්‍රියදර්ශන

# grade 7

# Final Medal Maths Exam - September

- **අංක 1 සිට 20 තෙක් ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරන්න. ටයිප් කරන්න**

1) $\frac{2}{5}$ ප්‍රතිශතයක් ලෙස ලියන්න

.............................................

---

2) 60 සහ 45 හි කුඩාම පොදු ගුණාකාරය සොයන්න

.............................................


---

3) දෝඩම් සහ ජලය 1:6 අනුපාතයට මිශ්‍ර කර බීමක් සාදා ගනු ලබයි. යොදන ලද දෝඩම් යුෂ ප්‍රමාණය 50ml නම් සාදන ලද මුළු බීම ප්‍රමාණය කොපමණ ද?

............................................ ml

---

4) පහත දැක්වෙන රූපයෙහි වර්ගඵලය සොයන්න.




........................................$cm^2$

---

5) $\frac{1}{3}+\frac{1}{6}$ සුළු කරන්න (පිළිතුර දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න)

.............................................

LIVEWORKSHEETS

6) පැනක තොග මිළ රු. 9.75කි. එවැනි පෑන් 100ක මිල කොපමණ ද?

රු.......................................

7) සුළු කරන්න. (−7)+(−10)


.......................................

8) සුළු කරන්න.

| $l$ | m$l$ |
|---|---|
| 5 | 375 |
| | ×6 |
| ☐ | ☐ |

9) පහත දැක්වෙන රූපයෙහි පරිමිතිය සොයන්න

.......................................cm




10) 25g ස්කන්ධය mg වලින් ලියන්න.

.......................................mg

11) රු. 600 මුදලක් A සහ B අතර 2:1 අනුපාතයට බෙදූ විට A ට ලැබෙන මුදල සොයන්න.

රු.......................................

තරුවෙන් ගණිතය


LIVEWORKSHEETS

12) පහත දැක්වෙනුයේ ඝන වස්තු 2 ක මුහුණත්, දාර හා ශීර්ෂ පිළිබඳ තොරතුරු වේ. හිස්තැන් සම්පූර්ණ කරන්න.

| සන වස්තුව | මුහුණත් | ශීර්ෂ | දාර |
|---|---|---|---|
| A | 6 | .......... | 12 |
| B | .......... | 4 | 6 |


13) රූපයේ දැක්වෙන ඝනකයක හැඩැති කුඩා වීදුරු භාජනයක අඩක් ජලයෙන් පිරී ඇත.භාජනයේ ඇති ජල පරිමාව සොයන්න

..........................................ml




14) මෙම රූපයේ,මහා කෝණයක් නම් කරන්න.

1) $B\hat{A}C$    2) $A\hat{C}B$    3) $D\hat{B}C$    4) $B\hat{D}C$




15) සුළු කරන්න. 3+7×5

..............................................

LIVEWORKSHEETS

16) පහත ගණිත උපකරණ අතරින් සමාන්තර දාර සහිත උපකරණය තෝරන්න

**i.** විහිත චතුරස්‍රය **ii.** කෝණ මානය **iii.** සරල දාරය

17) මිනිසුන් තිදෙනෙක් විසින් රැස්කරගත් මී පැණි 50l 25ml ඔවුන් අතර සමසේ බෙදූ විට එක් අයෙකුට ලැබුණු ප්‍රමාණය සොයන්න

.........*l* ............*ml*


18) 12m දිග රිබන් පටියක් 1: 2: 3 අනුපාතයට කැබලි කළ විට කුඩාම කැබැල්ලේ දිග සොයන්න.

..........................................m

19) සමතල මුහුණත් සහිත ඝන වස්තුවක මුහුණත් ගණන 5 හා දාර ගණන 8 වේ. ඔයිලර් සම්බන්ධතාවයෙන් එහි ශීර්ෂ ගණන සොයන්න

..........................................

20)රූපයේ අඳුරු කළ කොටස මුළු කොටස්වලින් ප්‍රතිශතයක් ලෙස දක්වන්න



..........................................%

ගණිතය
දිල්ශාන් බී ප්‍රියදර්ශන


LIVEWORKSHEETS

# II කොටස

- **අසා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර ඉදිරියේ ඇති කොටුව තුළ ටයිප් කරන්න. පිළිතුරු තේරීම සඳහා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරන්න.** ***(සැ.යු. රු, රුපියල්, අංශක,*** $cm, m$ ***ලෙස ඒකක වර්ග කිසිවක් නොදමන්න)***

01)

**(a)** පහත රූප සටහනෙහි දැක්වෙන **ත්‍රිකෝණයෙහි** එක් එක් පාදයන් හි දිග දක්වා ඇත.




**(i)** ත්‍රිකෝණයේ **පරිමිතිය** x හා y ඇසුරින් **වීජීය ප්‍රකාශනයක්** ලියා දක්වන්න.

..............................................

**(ii)** x=8 cm, y=4 cm නම් ඉහත වීජීය ප්‍රකාශනයට ආදේශ කර ත්‍රිකෝණයේ **පරිමිතිය සොයන්න.**

..........................................cm

**(b)** ඇපල් ගෙඩි 5 ක් මිලදී ගැනීම සඳහා රු. 150 ක් දුන් විට රු. 15 ක මුදලක් **ඉතිරි** ලැබුණි.

**(i)** ඇපල් ගෙඩියක මිල **x** ලෙස ගෙන **x** ඇතුළත් **සමීකරණයක් ගොඩනගන්න.**

..............................................

**(ii)** සමීකරණය විසඳා ඇපල් **ගෙඩියක මිල සොයන්න.**

..............................................


තරුවෙන් ගණිතය
දිල්ශාන් බී ප්‍රියදර්ශන
LIVEWORKSHEETS

02) (a)ඍජුකෝණාස්‍රාකාර ශාලාවක දිග හා පළල පිළිවෙළින් **30 m** හා **12 m** වේ. එම ශාලාවහි බිම් ඇතිරීම සඳහා පැත්තක දිග $\frac{1}{2}m$ වන **සමචතුරස්‍රාකාර ටයිල් කැට** යොදා ගැනීමට නියමිතය.

**(i)** ශාලාවේ බිමෙහි **වර්ගඵලය** ගණනය කරන්න.

| ........................................$m^2$ |
|---|

**(ii)** ශාලාවේ දිග පැත්තට, එක් පෙළියක් ඇල්ලීමට අවශ්‍ය ටයිල් කැට සංඛ්‍යාව සොයන්න.

| ................................................ |
|---|

**(iii)** ශාලාවේ බිම සම්පූර්ණයෙන් ම ඇතිරීම සඳහා අවශ්‍ය ටයිල් කැට සංඛ්‍යාව කොපමණ දැයි සොයන්න.

| ................................................ |
|---|

(b) පහත දැක්වෙන සංඛ්‍යා ප්‍රතිශත ලෙස දක්වන්න.

(i) $\frac{3}{4}$ ..............................................%

(ii) 0.8 ..............................................%

තරුවෙන් ගණිතය
දිල්ශාන් බී ප්‍රියදර්ශන

LIVEWORKSHEETS

(03)

(a). අලෙවි කිරීම සඳහා මිළ දී ගත් **අඹ තොගයක තිබූ ඉදුණු** සහ **අමු අඹ** අතර **අනුපාතය 5:1** විය. එහි **ඉදුණු අඹ ගෙඩි සංඛ්‍යාව 250** **ක්** නම්,

**(i) මිළ දී ගත් මුළු අඹ ගෙඩි සංඛ්‍යාව** සොයන්න.

..........................................

**(ii).එක් අඹ ගෙඩියක් රු. 10** බැගින් මිල දී ගත්තේ නම් **අඹ තොගය සඳහා** වැය කළ මුළු මුදල සොයන්න.

රු..........................................

**(b) සුනිමල්** රු. 300 ක මුදලක් වෙළඳසැලක් වෙත ලබාදී පහත දක්වෙන **භාණ්ඩ මිළදී** ගෙන ඉතිරි මුදල රැගෙන යන ලදී.

| භාණ්ඩය | ඒකකයක මිළ (රු.) | මිළදී ගත් ප්‍රමාණය |
|---|---|---|
| පෑන | 9.50 | 5 |
| අභ්‍යාස පොත | 31.25 | 6 |

**(i)** භාණ්ඩ සඳහා වැය කළ මුළු මුදල සොයන්න.

රු..........................................

**(ii)** ඉතිරි වූ මුදල කොපමණ ද?

රු..........................................

තරුවෙන් ගණිතය
දිල්ශාන් බී ප්‍රියදර්ශන

LIVEWORKSHEETS

**(04)**

**a).**

(i). $4\frac{3}{5}$ ……… $4\frac{3}{8}$ ; >, < හෝ = යන සංකේත අතුරින් ගැලපෙන සංකේතය තෝරන්න.

1) >  2) <  3) =

(ii). $1\frac{3}{8}+\frac{2}{5}$ හි අගය සොයන්න.

1) $1\frac{31}{40}kg$  2) $4\frac{3}{15}kg$  3) $5\frac{8}{20}kg$  4) $4\frac{11}{30}kg$

**b).**

i. වෙළෙන්දෙක් **වට්ටක්කා** ගෙඩියකින් $\frac{1}{2}$ ක් පළමු දිනේ ද $\frac{1}{4}$ ක් දෙවන දිනේ ද **විකුණන** ලදී.

දින දෙකේම **විකුණන ලද කොටස** වට්ටක්කා ගෙඩියෙන් කවර භාගයක් ද?

1) $\frac{3}{8}kg$  2) $\frac{3}{4}kg$  3) $5\frac{8}{2}kg$  4) $4\frac{1}{3}kg$

ii. පළමු දිනේ විකුණු වට්ටක්කා ප්‍රමාණය 3 kg 500 g කි. **වට්ටක්කා ගෙඩියේ ස්කන්ධය** සොයන්න.(kg වලින්)

……………………………………kg

iii. දින දෙකේම විකුණු පසු ඉතිරි වට්ටක්කා **කැබැල්ලේ ස්කන්ධය** ගණනය කරන්න(**g වලින්**)

……………………………………g

තරුවෙන් ගණිතය
දිල්ශාන් බී ප්‍රියදර්ශන
LIVEWORKSHEETS